# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1921/50 - 2015 ජූලි මස 01 වැනි බදාදා - 2015.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය මහීපාල හේරත් වන මම, අංක 1908/34 - 2015 අප්‍රේල් මස දෙවැනි දින බ්‍රහස්පතින්ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන මගින් 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමි ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(1) වගන්තිය යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා පත්කරන ලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු සමන් වික්‍රම වික්‍රමාරච්චි මහතාගේ පත්කිරීම ඉදිරි මාස 03ක කාලය සඳහා දීර්ඝ කරමි.

02. එසේම එකී ගැසට් නිවේදනයේ 2 හා 3 වගන්තිවලින් ප්‍රකාශයට පත් කළ විධිවිධානයන් ද ඉදිරියට එලෙසම බල පැවැත්වෙන බව නිවේදනය කරමි.

මහීපාල හේරත්,<br>
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර,<br>
ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස<br>
හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය,<br>
සබරගමුව පළාත.

2015 ජූනි මස 30 වැනි දින,<br>
රත්නපුර නව නගරයේ පිහිටි,<br>
සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 2491 — 16 (2015/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*